ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: **dcommunications@cbsl.lk, communications@cbsl.lk**
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2019 නොවැම්බර් 14 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2019 ඔක්තෝබර්

2019 ඔක්තෝබර් මාසයේ දී නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2019 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශක අගය 57.6 දක්වා ඉහළ ගිය අතර නිෂ්පාදන සහ නව ඇණවුම් වල සිදුවූ ඉහළ යාම මේ කෙරෙහි ප්‍රධාන වශයෙන්ම හේතු විය.

නිෂ්පාදන සහ නව ඇණවුම් වල සිදුවූ මෙම ඉහළ යාම ඉදිරියේ දී එළඹෙන උත්සව සමයේ ඇතිවිය හැකි ඉල්ලුම සපුරාලීම සඳහා, විශේෂයෙන්ම, ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයෙහි ක්‍රියාකාරකම් ඉහළ යාම මගින් නිරීක්ෂණය කළ හැකි විය. මේ අතර, ආහාර හා පාන වර්ග සහ රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයන්හි සේවා නියුක්තිය ද ඉහළ යන ලදී. ඉදිරි කාලයේදී එළඹෙන ඉහළ ඉල්ලුම සපුරාලීම සඳහා නිෂ්පාදන ක්‍රියාකාරකම් ඉහළ නංවාලීම සඳහා සිදු කරන ලද බඳවාගැනීම් හේතුවෙන් සේවා නියුක්තිය ඉහළ යන ලදී.

| විචල්‍යය | සැප්. | ඔක්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **54.7** | **57.6** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 58.1 | 59.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 52.0 | 60.2 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 55.6 | 58.2 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ගැනුම් තොගය | 56.6 | 54.1 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 50.0 | 50.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

තවද, නව ඇණවුම් සහ නිෂ්පාදන වැඩි වේගයකින් වර්ධනය වුව ද, ගැනුම් තොග අඩු වේගයකින් වර්ධනය වීම සඳහා, පසුගිය මාස වල එක්රැස් කරගත් අමුද්‍රව්‍ය තොග ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, ඇණවුමක් සැපැයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය අඩු වේගයකින් වර්ධනය විය.

සලකනු ලැබූ කාල සීමාවේදී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සියලුම උප දර්ශක, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරමින්, නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සමස්ත වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය | 2019 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 2.9 කා ඉහළ යාමකි. |
|---|---|
| **57.6** | |

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.1 කින් ඉහළ යමින් 2019 ඔක්තෝබර් මාසයේදී 49.8 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2019 ඔක්තෝබර් මාසයේදී, ඉන්දියාව සහ සිංගප්පූරුව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි අඩුවීමක් පෙන්නුම් කරන ලද අතර එක්සත් රාජධානිය, රුසියාව, චීනය, එක්සත් ජනපදය සහ යුරෝපා කලාපය නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2019 නොවැම්බර් 13 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමගින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

2019 ඔක්තෝබර් මාසයේ දී සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 56.9 දක්වා ඉහළ ගිය අතර, නව ව්‍යාපාර සහ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සිදු වූ ඉහළ වර්ධනය ඊට ප්‍රධාන වශයෙන් හේතු විය.

නව ව්‍යාපාර, මාස 19 කට පසු වාර්තා කළ ඉහළම අගය කරා ළඟා වූ අතර, මූල්‍ය සේවා සහ රක්ෂණ අංශ ඒ සඳහා ප්‍රමුඛ දායකත්වයක් සපයන ලදී. එසේම, 2019 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව, ඔක්තෝම්බර් මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සිදු වූ සැලකිය යුතු වර්ධනය සඳහා මූල්‍ය සේවා; මානව සෞඛ්‍ය ක්‍රියාකාරකම්; සහ තැපැල් හා භාණ්ඩ සේවා ක්‍රියාකාරකම් දායක විය. ව්‍යාපාර ක්‍රියාකාරකම්වල නිරීක්ෂණය කළ කැපී පෙනෙන වර්ධනයට එළැඹෙන ජනාධිපතිවරණය ඉලක්ක කොට ගෙන සිදු කරනු ලබන වෙළඳ ප්‍රචාරණ කටයුතු සහ බැංකුවල ප්‍රවර්ධන ක්‍රියාකාරකම් ඉහළ යෑම හේතු වී ඇත.

කෙසේවෙතත්, නව බඳවා ගැනීම් ප්‍රමාද වීම සහ මිනිස් ශ්‍රමය යොදාගෙන සිදු කරනු ලබන ක්‍රියාකාරකම් ස්වයංක්‍රීය කිරීම, 2019 ඔක්තෝබර් මාසයේ දී සේවා අංශයේ සේවා නියුක්තිය අඛණ්ඩව සත්වන වරටත් එහි කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා අඩු අගයක පැවතීමට හේතුවිය. මේ අතර, මාස 20 ක් තුළ නිරීක්ෂණය කළ අඩු වීමට පසු 2019 ඔක්තෝම්බර් මාසයේ දී, නිම කිරීමට ඇති කාර්යයන් ඉහළ ගොස් ඇති අතර එයින් පෙන්නුම් කරන්නේ මෙම අංශයේ අතිරික්ත ධාරිතාව අඩුවෙමින් පවතින බවයි. නව ව්‍යාපාර සහ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල ශක්තිමත් වර්ධනයක් මධ්‍යයේ වුවද ඊකියා මට්ටම්වල පහළ යෑමත් මීට අර්ධ වශයෙන් හේතු විය හැකිය.

| විචල්‍යය | සැප්. | ඔක්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **52.7** | **56.9** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| **උප දර්ශක** | | | | |
| නව ව්‍යාපාර | 55.0 | 61.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 52.5 | 59.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 47.0 | 44.0 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 45.8 | 51.6 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 63.4 | 68.2 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සේවා සපයන්නන්ගේ අපේක්ෂාවන් ඉදිරි මාස තුන සඳහා ඉහළ අගයක් ගැනීම කෙරෙහි, ඉදිරියේ දී එළැඹෙන කාලය සංචාරක පැමිණීම බහුල වන සමය මෙන්ම, උත්සව සමය වීමත්, ඉදිරියේ දී දේශපාලන ස්ථාවරත්වයක් ඇති වනු ඇතැයි බලාපොරොත්තු වීමත් හේතු විය. තවද, පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ඔවුන්ගේ ව්‍යාපාර යථා තත්ත්වයට පත් වූ බව ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කරන ලදී.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**56.9**

**2019 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 4.2 ක ඉහළ යාමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 ඔක්තෝබර් මාසයේ දී පසුගිය වසර තුනහමාර තුළ වාර්තා වූ අඩුම අගය වන 51.0 දක්වා පහළ යන ලදී.

ඇමරිකා එක්සත් ජනපදය සහ චීනය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ 2019 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව ඔක්තෝබර් මාසයේ දී වර්ධනය වූ බව පෙන්නුම් කළ අතර, ජපානය සහ ඉන්දියාව යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශවල පහළ යෑමක් පෙන්නුම් කරන ලදී. එක්සත් රාජධානිය තුළ සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය නොවෙනස්ව පැවතුණි.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2019 නොවැම්බර් 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.